# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/29/2021 (PSC)

AAT/30/2021(PSC)

1. පී.එම්.ජයන්ත, ග්‍රාම නිලධාරී,
2. ආර්.එම්.ආර්.බණ්ඩාර, ග්‍රාම නිලධාරී

අභියාචකවරුන්

එදිරිව

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වගඋත්තරකරු

**දිනය :-2025.04.22**

**ඉදිරියේ දී :-** **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**

**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**

**එස්.නන්දසේකරන් (සාමාජික)**

**පාර්ශවකරුවන් :-** **අභියාචකවරුන් වෙනුවෙන් නීතිඥ ලහිරු වෙල්ගම මහතා,**

**වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, සචිනි රඹුක්වැල්ල මිය,**

**ජේ.ජේ.රත්නසිරි (සාමාජික) පරි.අභි.විනිශ්චය අධිකාරය.**

## -<u>නියෝගය</u>-

**පී.එම්.ජයන්ත හා ආර්.එම්.ආර්. බණ්ඩාර යන අභියාචකවරුන් ග්‍රාම නිලධාරීන් ලෙස සේවය කරනු ලබයි. ඔවුන්ගේ 2020.12.23 දින දරණ අභියාචනය මගින් දන්වා සිටින්නේ, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පළකරන ලද අංක 1982 හා 2016.08.16 දින දරණ ගැසට් පත්‍රය මගින් කළමනාකරණ සහකාර අධිපන්තියට අයත් පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර සඳහා කුසලතා පදනම**

යටතේ තනතුරු 71ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත්‍ර කැඳවනු ලැබූ බවත්, ඔවුන් එම විභාගයට සහ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරු සඳහා සුදුසුකම් ලබා ගත් බවත්, පුරප්පාඩු 71ක් වූ එම විභාගයේ තනතුරු 67ක් පමණක් පිරවනු ලැබූ බවත්, අභියාචක ඇතුළු තවත් 10 දෙනෙක් අදාළ විභාගයෙන් සම ලකුණු ලබාගෙන කුසලතා ලේඛනයේ 68 වන ස්ථානයේ පසුවූ බවත්, ඉතිරි තනතුරු 04 සඳහා තමන් පත්කරන ලෙසය. ඒ පිළිබඳව ඉල්ලීම් කර අදාළ 10 දෙනා 2020 ජනවාරි මස ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ඉල්ලීම් කළ බවත්, එසේම අදාළ 10 දෙනා ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා 2019.10.02 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා කළ බවත්, එම අභියාචනා වලට පිළිතුරු ලෙස ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ HA/3/1/12/3-1 හා 2020.05.21 දින ලිපිය මගින් අභියාචනා ප්‍රතික්ෂේප කරන බව දන්වා ඇති බවත්, ඉන් තෘප්තිමත් නොවූ අභියාචකවරුන් මෙම අධිකාරයට AAT/29/2021 හා AAT/30/2021 අංක හා 2020.12.23 දින අභියාචනාව ඉදිරිපත් කර ඇත. මෙම අභියාචනය තුළින් ඔවුන් ඉල්ලා සිටින්නේ, අදාළ අභියාචකගේ ඇමුණුම්,

අ. X5 ලිපියේ සඳහන් තීරණය වැරදි බවට ප්‍රකාශ කර ඉවත් කරන ලෙස සහ /ප්‍රතිශෝධනය කරන ලෙස,

ආ. අභියාචකවරුන් පරිපාලන ග්‍රාම නිලධාරී අධිශ්‍රේණියේ තනතුරු වල උසස්කර පිහිටුවන ලෙස,

ඇ. ගරු විනිශ්චය අධිකාරයට මැනවැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබා දෙන ලෙස.

රාජ්‍ය සේවා කොමිෂම ඔවුන්ගේ අංක PSC/APP/07/165/2021 හා 2021.07.29 දින දරණ ලිපිය මගින් මෙම අධිකාරයට ඔවුන්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. අදාළ ලිපියට අනුව,

2 වන ඡේදයේ මෙම අයට අමතරව තවත් 7 දෙනෙක් මුළුගණන 09 දෙනෙක් මෙම තනතුර සඳහා අභියාචනා ඉදිරිපත් කර ඇති බව,

3 වන ඡේදයට අනුව අභියාචකවරුන් සඳහන් කරන X4 හා X5 දරණ ලිපි මගින් ඉදිරිපත් කර ඇත්තේ රාජ්‍ය සේවා කොමිෂම මගින් ලබාදුන් තීරණයන් නොවන බව,

4 වන ඡේදයට අනුව 2002 අංක 4 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරී පනත යටතේ වගනිතිය 4 -1 මගින් සති 4ක් තුළ අභියාචනාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ කොන්දේසිය කඩවී ඇති බවත්, අදාළ පනතට අනුව කටයුතු සිදුවී නැති බවත් ය.

5 වන ඡේදය යටතේ මෙම අභියාචනය නිත්‍යානුකූල පරිදි කටයුතු සිදුවී නැති බැවින්, විභාගයට නොගෙන, ප්‍රතික්ෂේප කරන ලෙසත් ඉල්ලා සිටී..

දැනටමත් මෙම අභියාචනය විභාග කර, තීන්දුව ප්‍රකාශ කරන අවස්ථාව දක්වා පැමිණ ඇති බැවින්, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ නොකරමි.

කෙසේ වුවද, අභියාචකයන්ගේ 2020.12.23 දරණ අභියාචනයට අවධානය යොමු කිරීමේ දී, පහත සඳහන් කරුණු පිළිබඳව අභියාචකවරුන් හොඳින් කරුණු දැන සිටි බව තහවුරු වේ. අදාළ අභියාචනයේ 2 වන ඡේදය අනුව කුසලතා පදනම යටතේ තනතුරු 71ක් පිරවීමට නියමිතව තිබූ බව,

3 ඡේදය අනුව තනතුරු 67ක් සඳහා සුදුසුකම් ලැබූ අය තෝරා ගෙන පත්වීම් ලබා දී ඇති බව,

4 ඡේදය අනුව මෙම දෙදෙනා ඇතුළුව අභියාචකවරුන් 10 දෙනෙකු සම ලකුණු ලැබ අදාළ ලේඛනයේ 68 ස්ථානයේ රැදී සිටින බව,

5 ඡේදය අනුව පුරප්පාඩු 4ක් පමණක් ඉතිරිව ඇති බව,

10 ඡේදය අනුව අධිසේවක පදනම මත තනතුරු 10ක් ඇති කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව එකග නොවන බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක D M S 0069 Vol -IV හා 2020.05.12 දින ලිපිය අනුව හේතු පැහැදිලි කර ඇත. "**පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරු අනුමත කරනු ලබන පොදු නිර්නායකය වන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට එක බැවින් වන අතර එම පොදු නිර්නායකයෙන් බැහැර වීමට පදනමක් නොමැති බවය.**" මේ අනුව අදාළ පත්වීම් ලබා දීම පිළිබඳව නිත්‍යානුකූල තත්ත්වය අභියාචකවරුන් හොඳින්ම දැන සිටියදී තවදුරටත් අදාළ අභියාචනයේ පහත කරුණු ඉදිරිපත් කරයි.

11 ඡේදය අනුව 2020.11.30 දිනට පත්වීම් ලද අය පිළිබඳව ප්‍රසිද්ධ කළ නාමලේඛනයේ පත්වීම් ලැබීමට සිටි 12 මේ වන විට දෙනෙකු විශ්‍රාම ගොස් ඇති බව,

13 ඡේදයට අනුව මේ අනුව දැනටමත් අළුතින් පුරප්පාඩු 10ක් තවදුරටත් නිර්මාණය වි ඇති බව,

17 ඡේදය අනුව මේ වැනි ගැටළු පැන නැඟුන පෙර අවස්ථාවලදී රාජ්‍ය සේවා කොමිෂම අධිසේවක පදනම මත පත්වීම් ලබා දි ඇති බව,

19 ඡේදය අනුව අභියාචනය මෙම අධිකාරයට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වි ඇති බැවින්, ඒ පිළිබඳව සමාව අයැද සිටින බවත් ය.

ඉහත කරුණු අනුව අභියාචකවරුන් මෙම පත්කිරීම් පිළිබඳව නිත්‍යානුකූල තත්ත්වය මැනවින් දැන සිටි බව ඔප්පු වන අතර මෙම විනිශ්චය අධිකාරය

අවධානය යොමු කරන්නේ අභියාචනයේ සඳහන් 11, 13, 17, 19 ජේද මගින් කර ඇති ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව වැඩි දුරටත් විමසා බැලීමය.

මෙහිදී රාජ්‍ය සේවා කොමිෂම මගින් ඔවුන්ගේ අංක PSC/APP/7/1621 හා 2023.06.21, 2025.01.06 දින වලින් මෙම අධිකාරයට ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ පිළිබඳව අවධානය යොමු කරමි. එම ලිපි වලට අනුව 2016.08.26 දින ගැසට් නිවේදනය අනුව කුසලතා පදනම මත ග්‍රාම නිලධාරී තනතුරු 71 ක් පිරවීම සඳහා දැන්වීම් පළකර ඇති බවත්, 2017.12.30 දින අදාළ විභාගය පවත්වා ඇති බවත්, 2019 පෙබරවාරි මස 21, 22, 23, 24 යන දින වලදී ලිඛිත විභාගයෙන් 40% නොඅඩු ලකුණු ලැබූ 153 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ඇති බවත්, අදාළ ලිඛිත විභාගයේ දි සහ සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළම ලකුණු ලැබූ 77 දෙනෙකුගේ නාම ලේඛනයක් විභාග කොමසාරිස් විසින් රාජ්‍ය සේවා කොමිෂම වෙත එවා ඇත. එසේ 77 දෙනෙකුගේ නම ලේඛනයක් එවීමට හේතුව වි ඇත්තේ අවසාන 10 දෙනා සම ලකුණු ලබා තිබීමය. ඒ අනුව පුරප්පාඩු 71න් පුරප්පාඩු 67ක් සඳහා 2017.12.30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වීම් ලබා දී ඇත. එම ලේඛනයේ 68 ස්ථානයේ සම ලකුණු ලැබූ මෙම අභියාචකයන් 10 දෙනා සිටීමත්, පුරප්පාඩු 04ක් පමණත් තිබීමත්, මේ අයට පත්වීම් නොලැබීමට හේතුව ලෙස ප්‍රකාශ කර සිටී.

මෙම තත්ත්වයට අමතරව අදාළ ලිපියේ 5, 6, 7, 8 ජේද මගින් පැහැදිලි කර සිටින්නේ, මෙම තනතුරටම අදාළව පැවති සීමිත තරඟ විභාගයේ දි සුදුසුකම් ලැබූ, එහෙත් විභාග දෙපාර්තමේන්තුව මගින් සිදුවී ඇති තාක්ෂණික අතපසුවීමක් නිසා නිලධාරීන් දෙදෙනෙකුට පත්වීම් ලබා දීමට නොහැකි වී ඇති බවයි. ඒ අනුව කුසලතා පදනම මත ඉතිරිවී ඇති පුරප්පාඩු 4 තුළින් පුරප්පාඩු 2ක් සීමිත තරඟ විභාගය යටතේ අසාධාරණයට ලක් වූ දෙදෙනාට ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂම

තීරණය කළ බව සහ ඒ නිසා කුසලතා පදනම මත දැනට ඉතිරිව ඇත්තේ සත්‍යය ලෙසම පුරප්පාඩු 02 ක් පමනක් බවත් දන්වා සිටී.

මෙසේ කුසලතා තරඟ විභාගය යටතේ පැවති පුරප්පාඩු 4 අතුරින් 02ක් සීමිත තරඟ විභාගය සමත් දෙදෙනෙකු වෙත ලබාදීම පිළිබඳව අභියාචකවරුන් ඔවුන්ගේ නිරීක්ෂණ වලදී කරුණු දන්වා සිටී. එය වැරදි ක්‍රියාවක් බවද පෙන්වා දී ඇත. එසේ වුවත්, මේ පිළිබඳව මෙයට ඉහත ද මෙම කරුණු පිළිබඳව මෙම අධිකාරයේ අභියාචකවරු 10 දෙනෙක් AAT/36/2019/PSC, AAT/39/2019/PSC, AAT/40/2019/PSC, AAT/45/2019/PSC, AAT/46/2019/PSC, AAT/47/2019/PSC, AAT/48/2019/PSC, AAT/55/2019/PSC, AAT/56/2019/PSC, AAT/76/2019/PSC, අංක යටතේ අභියාචනා ගොනු කර ඇත. මෙම අධිකාරය විසින් 2023.10.04 දින තීන්දුව මගින් මෙම අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත. ඒ තීන්දුව අනුව නැවත වරක් ඒ පිළිබඳව තීරණයක් ලබා දීම අවශ්‍ය නොවේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඔවුන්ගේ 2024.11.08 දින මෙම අධිකාරයට ඉදිරිපත් කරන ලද ලිපියේ 2 ජේදය යටතේ එය ඔප්පු කර ඇත. එසේම අදාළ ලිපියේ 3 ජේදය අනුව වැඩි දුරටත් දන්වා සිටින්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධිසේවක පදනම මත යම් පත්වීමක් ලබා දි ඇත්නම්, එය සිදුකර ඇත්තේ මෙම අධිකාරයේ නියෝගයක් මත හෝ ඉහළ අධිකරණ නියෝගයක් මත බවයි. එසේ නොමැතිව පුරප්පාඩු නොමැති අවස්ථාවල අධිසේවක පදනම මත පත්වීම් ලබා දි නැති බව ප්‍රකාශ කර සිටී. මෙම අවස්ථාවේ දී මේ ගැටලුවට විසඳුමක් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කර අධිසේවක පදනම මත තනතුරු 10ක් ඇති කර ගැනීමට කටයුතු කරන ලෙස 2019.11.20 දින දරණ ලිපියෙන් ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට උපදෙස් ලබා දී ඇත. නමුත් කළමනාකරණ සේවා

දෙපාර්තමේන්තුව පැහැදිලි හේතු සහිතව එම ඉල්ලීම 2020.01.23 දින ලිපියෙන් ප්‍රතික්ෂේප කර ඇත. ඒ එකඟ නොවීම මත එම ඉල්ලීමට ඉඩදී නැත.

අභියාචකවරුන්ගේ අනික් ඉල්ලීම වන්නේ, 2020.11.30 දින වන විට අදාළ ලේඛනයේ සිටි සමහර අය විශ්‍රාම ගොස් සිටි බැවින්, පුරප්පාඩු 10ක් අලුතින් නිර්මාණය වි ඇති බවයි. ඒ තනතුරු වලට අභියාචකවරුන් පත්කරන ලෙසත්ය. නමුත් 2016.08.16 දැන්වීම් ප්‍රසිද්ධ කිරීමේ දී පුරප්පාඩු 71ක් ලෙස ප්‍රසිද්ධ කිරීම හා 2017.12.30 විභාගය පවත්වා 2019 පෙබරවාරි මස සම්මුඛ පරීක්ෂණ ද පවත්වා ඉහළම ලකුණු ලැබූ 67 දෙනෙක් සඳහා 2017.12.30 (විභාගය පැවැත්වූ දිනය) දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී ඇති බැවින්, පසුව නිර්මාණය වූ පුරප්පාඩු සඳහා පත්වීම් දෙන්නේ කුමන දිනය පදනම් කරගෙනද යන ගැටළුව පැන නැගී, ඒ අනුව පසුව නිර්මානය වූ පුරප්පාඩු සඳහා මෙම අයට පත්වීම් ලබා දීම සුදුසු නොවන බව පෙනී යයි. එසේම පසුව ඇතිවූ මෙම පුරප්පාඩු ඇතුළත්ව කුසලතා පදනම මත පරිපාලන ග්‍රාම නිලධාරී බඳවා ගැනීමේ ඊළඟ විභාගය 2021.12.11 දින පවත්වා ඇත. මෙම විභාගයෙන් සම ලකුණු ලබා 68 වන ස්ථානයේ සිටි 10 දෙනා අතරින් 5 දෙනෙක් 2021.12.11 දින පැවැත්වූ විභාගය සමත් වී පත්වීම් ලබාගෙන ඇත. ඒ බැව් පැහැදිලි වන්නේ, මෙම අභියාචකවරු දෙදෙනා සමඟ මෙම අධිකාරයට අභියාචනා ඉදිරිපත් කළ 09 දෙනා අතුරින් අංක AAT/24/2021/PSC, AAT/25/2021/PSC, AAT/27/2021/PSC, AAT/28/2021/PSC, AAT/31/2021/PSC, සඳහන් අභියාචකවරු වෙනුවෙන් නීතිඥ ලහිරු වෙල්ගම මහතා කරුණු පැහැදිලි කරමින් (අභියාචකවරුන් දැනටමත් අදාළ තනතුර ලබා ගෙන ඇති බැවින්) අභියාචනා ඉල්ලා අස්කර ගැනීමට අවසර ඉල්ලා ඇත. 2024.02.01 දින ඒ සඳහා මෙම අධිකාරය අනුමැතිය ලබා දී ඇත. මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ, සම ලකුණු ලබා සිටි 10 දෙනා අතුරින් 5 දෙනෙක් පසුව

පැවති විභාගය සමත් වී අදාළ පත්වීම් ලබාගෙන ඇති බවයි. ඒ අවස්ථාව මෙම අභියාචකයන් දෙදෙනාට ද තිබිණ. මේ අනුව පැහැදිලි වන්නේ, සම ලකුණු ලැබූ 10 දෙනා අතරින් දෙදෙනෙකු සඳහා පමණක් පෙරදාතම් කරමින් පත්වීම් ලබාදීම කිසිසේත්ම සුදුසු නොවන බවයි. ඒ අනිකුත් අභියාචකයන්ට කරන බලවත් අගතියකි.

ඉහත සඳහන් සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දි අභියාචකවරුන්ගේ ඉල්ලීම සාධාරණ නොවන බව පෙනී යයි. එසේම රාජ්‍ය සේවා කොමිෂම පවසන පරිදි අදාළ ඉල්ලීම් නියමිත කාලය තුළ ඉදිරිපත් කර නැත. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර පනතේ විධිවිධාන අනුව සියළු සුදුසුකම් සපුරා ද නැත. මේ සියළු කරුණු අනුව අභියාචනාවන් ප්‍රතිකෙෂ්ප කරමි.

මෙම තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් හා අභියාචක වෙත දන්වන්න.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-